# කාන්තාව

# සහ ක්ෂුද්‍ර

# මූල්‍ය ණය

WE EFFECT

LAW & SOCIETY TRUST

මෙම ලියවිල්ල බිනේන්ද්‍රි පෙරේරා විසින් නීතිය හා
සමාජභාරය සඳහා ලියන ලද වාර්තාවකින් සකස් කරන ලදී

# ශ්‍රී ලංකාවේ කාන්තාවන් : සමාජ, ආර්ථික සන්දර්භය

මධ්‍යම ප්‍රමාණයේ ආදායම් ලබන රටක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ජාතික මට්ටමින් දරිද්‍රතාවයේ පහළ බැසීමක් දැක ඇති නමුත්, විවිධ අංශ හරහා දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත්වන බොහෝ අය තවමත් සොයාගත හැකිය

2016 සඳහා නිල දරිද්‍රතා රේඛාව (OPL)

**රු. 4,166**

ඒ අනුව ඇස්තමේන්තුගත මුළු දුප්පත් ජනගහනය

**4.1%**

**නවතම සංඛ්‍යාලේඛනවලට අනුව දිස්ත්‍රික්ක 9 ක් දරිද්‍රතා රේඛාවට ඉහළින් ද, 15 ක් පහළින් ද එක් දිස්ත්‍රික්කයක් දරිද්‍රතා රේඛාවට සමානව ද තිබේ**

2020 මැයි මාසයේදී දරිද්‍රතා රේඛාව රුපියල් 5000 ඉක්මවා ගමන්කරනු ලැබීය




සංඛ්‍යාලේඛනවලදී අදෘශ්‍යමාන වන නිසාත්, පෞද්ගලික හා පොදු ක්ෂේත්‍රවල වෙනස්කම්වලට මුහුණ දෙන නිසාත් කාන්තාවන්ට දෙගුණයක් අභියෝග එල්ල වේ.

සමාජයේ සීමාවන්, සංස්කෘතික සම්මතයන් සහ ව්‍යුහාත්මක අසමානතාවයන් නිසා ඔවුන් විවිධ අවාසි වලට මුහුණ දෙමින් සිටිය.

**ශ්‍රී ලංකාවේ කාන්තා ජනගහනය දැනට**

**10,502,805**






කෙසේ වෙතත්, මෙම ග්‍රාමීය-වතු අංශය වර්ගීකරණය පදනම් වී ඇත්තේ යාවත්කාලීන කර නොමැති දත්ත මත වන අතර එබැවින් එහි දී නාගරික ජනගහනයේ වර්ධනය සහ නාගරික දරිද්‍රතාවය අඩුවෙන් නියෝජනය වේ



**දරිද්‍රතාවයෙන් පෙළෙන හා ග්‍රාමීය ආර්ථිකයන්හි කාන්තාවන්ට ඉහළට ගෙන ඒම සඳහා ක්ෂුද්‍ර මූල්‍යකරණය බහුලව භාවිතා විය**

කෙසේ වෙතත්, මෙය ශ්‍රී ලංකාව තුළ සෘණාත්මක බලපෑමක් ඇති කර ඇත්තේ ධනවාදී නියමයන් අනුව එහි දී කාන්තාවන් සවිබල ගැන්වීමකට වඩා ණය උගුල්වලට ඇද දමන නිසාය

නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍යකරණය ණයගැතිභාවයට හේතු වී ඇති අතර, සියදිවි නසාගැනීම් වලින් ආසන්න වශයෙන් 200 ක් පමණ මිය ගොස් ඇත. එයින් වැඩිපිරිසක් කාන්තාවන්ය. සහන සැලසීම සඳහා නෛතික හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම් අවුල් සහගත හා තාවකාලික ය.

ණය හා ක්ෂුද්‍ර මූල්‍ය අර්බුදය ඔවුන් මුහුණ දෙන සමාජ, ආර්ථික හා සංස්කෘතික තත්වයන්ට ඇති කරන බලපෑම අවබෝධ කර ගැනීම සඳහා නීතිය හා සමාජ භාරය විසින් ග්‍රාමීය හා වැවිලි අංශවල කාන්තාවන් සමග සම්මුඛ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී. ඒවායින් සමහරක් මෙහි සාකච්ඡා කෙරේ–

## සමාජ සම්මතයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසමානතාවය

පවුලක මූලික රැකවරණය සපයන්නන් වන්නේ කාන්තාවන් ය.

ඔවුන් ජීවත් වන සමාජ, ආර්ථික හා සංස්කෘතික සන්දර්භය සහ දියණිය, බිරිඳ, මව සහ සහෝදරිය ලෙස ඔවුන් ඉටු කරන කාර්යභාරය මගින් ඔවුන්ව අර්ථ ගැන්වේ.

මීට අමතරව, ඔවුන් ආර්ථික කටයුතුවලට ද සහභාගී වේ.

මෙම බහුවිධ වගකීම් භාර ගන්නා අතරම ඔවුන්ගේ ස්වාධීනත්වය, අභිමානය සහ ස්වාධීනත්වය සඳහා ආරක්ෂාව නොමැතිකම ද තිබේ.

## කාන්තාවන්ගේ රැකියාව සහ ජීවනෝපායන් ඇගයීම

**සමහර වෘත්තීන් 'කාන්තා රැකියාවන්' ලෙස ඒකාකෘති කොට**



කර්මාන්ත කිහිපයක් සඳහා ඔවුන්ගේ වැදගත් දායකත්වය තිබුණද, ඔවුන්ගේ ප්‍රතිපත්ති, වැටුප් සහ වෘත්තීය අපේක්ෂාවන් සීමිතය.

ඔවුන් දුෂ්කර සේවා තත්වයන්ට මුහුණ දෙයි: දිගු පැය, සනීපාරක්ෂක පහසුකම් නොමැතිකම, වෘත්තීය රෝග සහ ආබාධ, ලිංගික හිරිහැර හා බිය ගැන්වීම්.

**මීට අමතරව, නිවසේදී වැඩිහිටියන්, දරුවන් හා ආබාධිත පුද්ගලයින් රැකබලා ගැනීම සඳහා ඔවුන් වගකිව යුතුය**

එමගින් ගෙවිය යුතු 'රැකවරණය ලබාදීමේ පිරිවැය' අඩු කෙරෙන අතරම පිරිමින්ට ආර්ථික වශයෙන් වඩා ක්‍රියාශීලී වීමට ඉඩ  සලසය. එවැනි රැකවරණය ලබා දීමේ රාජකාරිය යනු රජයේ සහය ලැබිය යුතු වගකීමකි.

එවැනි සීමාවන් නිසා ඔවුන්ගේ වෘත්තීය අපේක්ෂාවන්හි දියුණුව වැළැක්වීම සිදුවන අතරම ඔවුන් මුහුණ දෙන සංස්කෘතික වශයෙන් කාවැදී ඇති අසමානතාවයන් බලාත්මක කිරීම ද සිදුවේ.



## අධ්‍යාපනය සඳහා අසමාන ප්‍රවේශය

ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමය තිබියදීත්, එහි ගුණාත්මකභාවය හා පිරිවැය ස්ථානය අනුව විවිධ වේ.

දුෂ්කරතා ඇති වු විට, තරුණ ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය මුලින්ම එහි බලපෑමට ලක්වේ.

දීර්ඝ කාලීන යුද්ධය, අවතැන්වීම් සහ ආරක්ෂාව පිළිබඳ කරුණු ද ඔවුන්ගේ අධ්‍යාපනය හා දියුණුව කෙරෙහි බලපායි.

## අසනීප කළමනාකරණය – ගැහැණුන් දැරිය යුතු බර



**රාජ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ හෝ පහසුකම්වල අසමාන භූගෝලීය ව්‍යාප්තිය පූර්ව ප්‍රසව හා පශ්චාත් ප්‍රසව සෞඛ්‍යය ඇතුළුව කාන්තාවන්ගේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යයට බලපාය**

ගැබ් ගැනීම සහ දරු ප්‍රසූතිය 'අසනීප' ලෙස හඳුන්වන අතර එමගින් පවුල සඳහා කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය සීමා කරය.

## නිවසේ පුරුෂාධිපත්‍යය – විවාහයට හා පවුලට කාන්තාවන්ට ඇති කරන බලපෑම

පිරිමින් රැකියා සඳහා ග්‍රාමීය සිට නාගරික ප්‍රදේශවලට/විදේශයන්ට සංක්‍රමණය වන විට පවුලේ භාරකාරයා සහ සැපයුම්කරු වශයෙන් කාන්තාවන් වගකීම දරයි.

කාන්තාවකට යම් ස්වයං පාලනයක් තිබිය හැකි නමුත් ඔවුන්ගේ වැටුප් හා වියදම් කළමනාකරණය පිරිමි ඥාතීන් විසින් තවමත් පාලනය කරනු ලැබේ. මෙමගින් ඔවුන්ගේ මූල්‍ය ස්වාධීනත්වය සීමා වේ.

**දැවැද්ද යනු විවාහයෙන් පසු තම දියණියන් සඳහා ආරක්ෂාව සපයන දෙයක් ලෙස වටහාගෙන තිබේ. නමුත් එය අධික පිරිවැයක් අවශ්‍ය වන පුරුෂාධිපත්‍යය සිරිතකි**



තම දියණියන්ට මූල්‍ය/ශාරීරික ආරක්ෂාව සැපයීමට අපොහොසත් වන පවුල් විසින් ඔවුන් විවාහකර දීම සිදුවේ. ඔවුන් අතරමග දී පාසැල් හැර යන විටද මෙය සිදු වේ.

## කාන්තාවන් සහ ඉඩම් අයිතිවාසිකම්

ඓතිහාසිකව ගත් කල, රජයේ ඉඩම් සහ වතු ඉඩම් සම්බන්ධ ශ්‍රී ලංකාවේ නීති මගින් කාන්තාවන්ට ඉඩම් අයිතිය අහිමි කර තිබේ.

මෙම නීති සහ පීතෘමූලික පරිපාලන භාවිතයන් පිරිමින්ට වැඩි වරප්‍රසාද ලබා දෙන අතර ඉඩම් අයිතිය, උරුමය සහ අනුප්‍රාප්තියට බලපාන කාන්තාවන්ගේ අයිතිවාසිකම් සීමා කර තිබේ.

වරණීය ඉඩම් අවසරය පිරිමින්ට වාසි වන අතර යුද්ධයෙන් අවතැන් වූ කාන්තාවන්ට ඔවුන්ගේ ජීවනෝපායන් සඳහා ඉඩම් ලබා ගැනීම දුෂ්කර වී තිබේග පිරිමින් මත මෙම යැපීම නිසා කාන්තාවන් ලිංගික අල්ලස් හා ප්‍රචණ්ඩත්වයට ගොදුරු වේ.

කාන්තාවන්ගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම සඳහා බැංකුවලින් ණය ලබා ගැනීම සඳහා ඇපකරයක් ලබා ගත හැකි ඉඩම් හිමිකර ගැනීමේ අවස්ථාව ප්‍රතික්ෂේප කිරීම ඔවුන්ගේ ආර්ථික ධාරිතාව සහ ආරක්ෂාව සීමා කර තිබේ

කාන්තාවන් ඔවුන්ගේ හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් වෙත යොමුවේ. මෙම සමාගම්වලදී ණය ලබා ගැනීම සඳහා ලියකියවිලි අවශ්‍ය නොවන නමුත් අනාරක්ෂිත ණය සඳහා ඉතා ඉහළ පොලියක් අය කරනු ලැබේ

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය

සම්මුඛ පර්යේෂණයට සහභාගි වූ කිහිප දෙනෙකුටම ගෘහස්ථ හිංසනය ඔවුන්ගේ පවුල් ජීවිතයේ සාමාන්‍ය අංගයක් විය.

සම්ප්‍රදායික පීතෘමූලික අපේක්ෂාවන් මගින් පිරිමින් මත සමාජ පීඩනයක් සහ දැඩි අපේක්ෂාවක් එක් කරයි.

මානසික උපකාර ලබා ගැනීමට ඔවුන්ව දිරිමත් නොකෙරේ. ඔවුන් විශේෂයෙන්ම පීඩනකාරී අවස්ථාවන්හිදී මෙම අවශ්‍යතාවයන් යටපත් කරගනී.

ඒ වෙනුවට, ඒවාට මුහුණ දීමේ යාන්ත්‍රණයක් ලෙස ඔවුන් මත්පැන් පානය කිරීම සහ පවුලේ සාමාජිකයන් පුරුද්දක් ලෙස හිංසනයට පත් කිරීම වැනි 'පිරිම්' ක්‍රියාකාරකම් වෙත යොමුවීම සිදුවේ.

පිරිමි ණය එකතු කරන්නන් කාන්තාවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට නුසුදුසු වේලාවන්වල අමතා ඔවුන්ගේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය නොසලකා හරිමින් තර්ජනය කරය. මෙම තර්ජනාත්මක හැසිරීම කාන්තාවන්ට වාරික ගෙවීමට හෝ ණය හිමියන් සමඟ රැස්වීම්වලට සහභාගී වීමට අපොහොසත් වන අවස්ථා දක්වා විහිදේ



පවුලේ පිරිමි සාමාජිකයන් කාන්තාවන්ට එරෙහි හිංසනය භාවිතා කරමින් ඔවුන්ගේ මූල්‍ය ගනුදෙනු කෙරෙහි අකමැත්ත ප්‍රකාශ කරයි.

## දේශපාලනයේ කාන්තාවන් : ඔවුන් කොහෙද?

ශ්‍රී ලංකාවේ ජාතික පාර්ලිමේන්තුව නිරතුරුවම සමානුපාතිකව අඩු කාන්තා මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් දැක තිබේග 2019 දී කාන්තාවන් සතුව ඇත්තේ ආසනවලින් 5.33% ක් පමණ.

ව්‍යවස්ථාදායක ආයතන විසින් පළාත් පාලන හා ප්‍රාදේශීය සභා, ජාතික ආණ්ඩුව මට්ටමින් කාන්තාවන්ට තම දේශපාලන සහභාගීත්වය පවත්වා ගැනීමට ඇති අවස්ථාවන් සඳහා ඇතිකළ කළ යුතුය.

ක්ෂුද්‍ර මූල්‍ය අර්බුදය නිසා කාන්තාවන්ට ඔවුන් මුහුණ දෙන ණය උගුල්වලට එරෙහිව සටන් කිරීම සඳහා විරෝධතා දැක්වීමට සහ විසඳීමට හා ප්‍රජා මූලික විසඳුම් විකල්ප සෙවීමට කිරීමට බල කෙරී ඇතග මෙමගින් ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරිත්වය පිළිබිඹු වේ.

කෙසේ වෙතත්, පළාත් පාලන මට්ටමින් කාන්තාවන් තම දේශපාලන සහභාගීත්වය පවත්වා ගැනීමට නම්, පළාත් සභා සහ මධ්‍යම රජය විසින් සැලකිය යුතු කැපවීමක් සහ ධාරිතාවයක් (මූල්‍යමය ධාරිතාවය ඇතුළුව) කාන්තාවන් සඳහා ලබාදිය යුතුයග කෙසේ වෙතත් ඒ සඳහා මේ අවස්ථාවේදී එළඹීමක් නැත.

මෙම ප්‍රකාශනය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ස්වීඩන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (Sida) සහ (We Effect) අරමුදලින් මුද්‍රණය කොට ඇත˚ මෙහි එන අදහස් හා අන්තර්ගතයන්ට ˜ිඩ හෝ We Effect ආයතන එකඟවීමක් අත්‍යවශ්‍යයෙන්ම නොවන අතර එය කතෘ හා ප්‍රකාශන ආයතනයේ වගකීමක් වේ